සැ. යු.- (i) 2017.07.07 දින පළ වූ අංක 2027 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2017 වර්ෂය සඳහා පොළොන්නරුව අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල සහ දෙමළ භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,028 - 2017 ජූලි මස 14 වැනි සිකුරාදා - 2017.07.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1340 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1342 |

සැ. යු.- (i) පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(ii) සිඩ්නි ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(iii) ජේ ශ්‍රී රංගා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අගෝස්තු මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජූලි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1337 - B 81188 — 5,403 (2017/07)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය

### නීති නිලධාරි (කොන්ත්‍රාත්) තනතුර

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ නීති නිලධාරි (කොන්ත්‍රාත්) තනතුර පුරප්පාඩුව සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය :*

අමාත්‍යාංශයට අදාළ නීතිමය කටයුතු, අමාත්‍යාංශ විෂය පථයට අයත් ආයතනවල පනත් කෙටුම්පත්, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සකස් කිරීම සහ සංවර්ධන කාර්යන්හි නීතිමය කටයුතු සඳහා උපදෙස් ලබා දීම වැනි කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

02. *සේවා කොන්දේසි :*
කොන්ත්‍රාත් පදනම මත වසර 03 ක කාලයක් සඳහා බඳවා ගැනීම සිදු කෙරෙන අතර කාර්ය සාධනය මත වාර්ෂිකව සේවාව දීර්ඝ කෙරේ. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වේ.

03. *වයස් සීමාව :*
අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට අවුරුදු 21ට නොඅඩු වූද 35 ට නොවැඩි වූද අය විය යුතුයි.

04. *මාසික වැටුප් පියවර :*
2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ ආරම්භක අනුරූප වැටුප් පියවර රු. 47,615 ක් වන අතර ඔබට අදාළව වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II පරිදි SL1-2016 වැටුප් කේතයට අදාළව හිමි වන ආරම්භක වැටුප් පියවරවල් අනුව වේ.

05. *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

06. *පළපුරුද්ද :*
දිවුරුම් දීමෙන් අනතුරුව නීතිඥයෙකු වශයෙන් වසර 03 කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

07. *වෙනත් :*
මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවිය හැකිවිය යුතුය.

08. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*
ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවාගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද පහත සඳහන් ලකුණු දීමේ පරිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ. :

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය :<br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br><br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br>*සටහන* : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතුයි.<br>(උපරිම ලකුණු සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්)<br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | <br><br><br>20<br>15<br><br>10<br><br>15<br><br>10<br><br><br><br><br><br><br><br><br>10 | **20** |
| 02. | **අතිරේක වෘත්තීය පළපුරුද්ද :**<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>(එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 35ක්<br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03 ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය) | | 35 |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03. | **භාෂා ප්‍රවීණතාවය** | | **20** |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | 20 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිබඳ විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 04. | **තොරතුරු තාක්ෂණය/පරිඝනක විද්‍යා පිළිබඳව ලබා ඇති සුදුසුකම්** | | **20** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 20 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 ක රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 10 | |
| | - මාස 06/පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| 06. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | | **05** |
| | මුළු එකතුව | | **100** |

*ඉල්ලුම් කළ යුතු පිළිවෙල* :

සියලු විස්තර ඇතුළත් කරමින් මේ සමග ඇති අයදුම්පත්‍රය උප්පැන්න සහතිකයේ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ පිටපතක්, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් සමග 2017.07.28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, 16 වන මහළ, සුහුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''නීති නිලධාරි (කොන්ත්‍රාත්) තනතුරට බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ඉංජි. බන්දුල වික්‍රමආරච්චි,
ලේකම්,
ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය.

16 වන මහළ,
සුහුරුපාය,
බත්තරමුල්ල.

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

*ආදර්ශ අයදුම්පත්‍ර*

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ නීති නිලධාරි (කොන්ත්‍රාත්) තනතුර සඳහා බඳවා ගැනීම

01. මුලකුරු සමග නම (මයා/මිය/මෙනවිය)
(සිංහලෙන්/දෙමළෙන්) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
(සිංහලෙන්/දෙමළෙන්) :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

03. උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

වර්ෂ :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්)
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

07. දුරකථන අංකය : ස්ථාවර :————.
ජංගම :————.

08. ඉංග්‍රීසි භාෂා සඳහා ලබා ඇති ඉහළම සුදුසුකම :————.

09. ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර ᠄

(i) විශ්වවිද්‍යාලය :————.
(ii) උපාධිය ලබා ගත් වර්ෂය :————.
(iii) ලබා ඇති උපාධිය :————.
(iv) භාෂා මාධ්‍යය :————.

9.1 ලබා ඇති පශ්චාත් උපාධිය පිළිබඳ විස්තර :————.

10. නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

11. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස කටයුතු කර ඇති කාලය :————.

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව්/නැත
12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

13. *අයදුම්කරුගේ සහතිකය* ᠄

.......................... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැරගිය අයෙකු සේ සලකා නොමැති බවත්, සහතික කරමි. මෙහි ඇතුලත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙලිවුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ᠄

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන .......................... නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........... දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම, සතුටුදායකය. සියලු වැටුප් වර්ධක උපයාගෙන නැත/ඇත.

15.2 ඉල්ලුම්කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම්පත්‍ර නිර්දේශ කරමි/නොකරමි. කිසිදු විනය පරීක්ෂණයකට ලක්වී නැත/ඇත.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.

07-460

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2017

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2017 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. විදුහල්පති සේවයේ සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියෙකු අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේනම් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - විෂයය නිර්දේශය පහත පරිදි වේ.

(1) සාමාන්‍ය ඉංග්‍රීසි (General English )
ලකුණු 100 - කාලය පැය 03

**විෂය නිර්දේශය**

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate :-

- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study :-

- Summary writing
- Report writing
- Essay writing

04. සාමාර්ථය ලැබීම සඳහා මෙම විෂයයට අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක හෝ ඊට වැඩ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. පහත දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ අංක 01 සිට 05 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර ඊට අදළ තොරතුරු විභාගයට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත්අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තව ද අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත් අලවා ඇත් ද යන්න පිළිබඳ නැවත විමසිලිමත් විය යුතු බවත්, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තුවට අදළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බවත් දන්වමි. ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම්පත් 2017 අගෝස්තු මස 14 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, ලිපිනයට ලැබෙන පරිදි විදුහල්පති/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්‍ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ මඟින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මඟින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතු අතර මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාග යේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදයී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

09. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාග දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග ශලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

11. *විභාග ගාස්තු* :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250.00 බැගින් අය කරනු ලැබේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂයට 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

13. සිංහල ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. තව ද මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පැලවත්ත,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2017

English Language Test for the Sri Lanka Principals Service - 2017

(විදුහල්පති/කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. (*අ*) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :———.
(මුල් අකුරු සමඟ ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා. GUNAWARDHANA, M. G. B. S. K.)

(*ආ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය :

(i) පෞද්ගලික :————.

(ii) රාජකාරි :————.

(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iv) රාජකාරි දුරකථන අංකය :————.

3. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

(ii) ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0

| |
|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(iii) උපන් දිනය :

වර්ෂය

| | | | |
|---|---|---|---|

මාසය

| | |
|---|---|

දිනය

| | |
|---|---|

4. විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.
පාසල/කාර්යාලය :————.
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

5. විෂයය අංකය :
(අදාළ විෂයය අංකය කොටුව තුළ ලියන්න.)

6. විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතේ විස්තර :
ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයා මගේ පාසලේ/කාර්යාලයේ නිලධාරියකු බව සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද/අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි. :————.

————,
විදුහල්පතිගේ/කොට්ඨාස හෝ
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

(විදුහල්පතිවරයෙකු නම් පාසලේ නම සඳහන් කරන්න.)
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

ලිපිනය :————.

දිනය :————.

(අදාළ නොවන වචන කපා හරින්න.)

07-382

---

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

## ආදර්ශ අයදුම්පත් කැඳවීමේ නිවේදනය සංශෝධනය කිරීම

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම - සීමිත**

අංක 2027 හා 2017.07.07 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරග විභාගයේ (2016/2017) ආදර්ශ අයදුම්පත් කැඳවීමේ නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. :-

I. **සංශෝධන අංක 01**

උක්ත *ගැසට්* නිවේදනයේ 05 වන පිටුවෙහි සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2017.08.11 දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

II. **සංශෝධන අංක 02**

උක්ත *ගැසට්* නිවේදනයේ 06 වන පිටුවෙහි අංක 07 මගින් දක්වා ඇති ලකුණු ලබා දීමේ පටිපාටිය පහත පරිදි සංශෝධනය වේ.

- සංශෝධනය කිරීමට පෙර

| *අනු. අංකය* | *විෂයය* |
|---|---|
| 03 | **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (උපරිම ලකුණු 10)**<br>පරිගණක දැනුම (උපරිම ලකුණු 05)<br><br>මාස 06කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05 ක් ලබා දෙනු ලැබේ.<br><br>මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ **සහතික පත්‍ර පාඨමාලාවක් පමණක්** සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03 ක් ලබා දෙනු ලැබේ.<br><br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02 ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇත්නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) |
| | ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය (උපරිම ලකුණු 05)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05ක් ලබා දෙනු ලැබේ.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ **සහතික පත්‍ර පාඨමාලාවක්** පමණක් සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03 ක් ලබා දෙනු ලැබේ.<br><br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02 ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇත්නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) |

- සංශෝධනය කිරීමෙන් පසු

| *අනු. අංකය* | *විෂයය* |
|---|---|
| 03 | **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (උපරිම ලකුණු 10)**<br>පරිගණක දැනුම (උපරිම ලකුණු 05)<br><br>මාස 06කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05ක් ලබා දෙනු ලැබේ.<br><br>මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ **සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක්** සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03ක් ලබා දෙනු ලැබේ.<br><br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 2ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇති නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) |
| | ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය (උපරිම ලකුණු 05)<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05ක් ලබා දෙනු ලැබේ.<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ **සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක්** සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03ක් ලබා දෙනු ලැබේ.<br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇති නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) |

III. සංශෝධන අංක 03

උක්ත *ගැසට්* නිවේදනයේ 08 වන පිටුවෙහි දක්වා ඇති 03 වන පරීක්ෂණය (සිවිල්) විභාගයෙහි වෛකල්පිත විෂයයන් පහත පරිදි සංශෝධනය වේ. :

- සංශෝධනය කිරීමට පෙර

3 වන පරීක්ෂණය (සිවිල්)

**වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයන්ගෙන් 01 ක් සමත් විය යුතුයි.**

| විෂය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| මූලික ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව | 05 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවාහනය | 06 | | | | | | |

- සංශෝධනය කිරීමෙන් පසු

3 වන පරීක්ෂණය (සිවිල්)

**වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයන්ගෙන් 01 ක් සමත් විය යුතුයි.**

| විෂයය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව ii | 42 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 43 | | | | | | |

IV. සංශෝධන අංක 04

උක්ත *ගැසට්* නිවේදනයේ 07 වන පිටුවෙහි දක්වා ඇති දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය පහත පරිදි සංශෝධනය වේ. :

- සංශෝධනය කිරීමට පෙර

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

දැනට මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරී/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරී/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (කළින් ම.ම.කා. සේවයේ) ...................................................... මහතා/ මහත්මිය/ මෙනවිය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති අතර, එම නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද මෙම ඉල්ලුම් පත්‍රය සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි. තවද, ඔහුට/ ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් අරඹා ඇති/ නැති බවත්, ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට කරුණු ඉදිරිපත් වී ඇති/ නැති බවත් සහතික කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න).

__________,
අත්සන හා නිලමුද්‍රාව (ලේකම්/ ප්‍රධාන ලේකම්/
දෙපාර්තමේන්තු ප්‍රධානී).

දිනය :__________.

■ සංශෝධනය කිරීමෙන් පසු

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

දැනට මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරී/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරී/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (කලින් ම.ම.කා. සේවයේ) ...................................................... මහතා/ මහත්මිය/ මෙනවිය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති අතර, එම නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද මෙම ඉල්ලුම් පත්‍රය සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි. තවද, ඔහුට/ ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් අරඹා ඇති/ නැති බවත්, ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට කරුණු ඉදිරිපත් වී ඇති/ නැති බවත් සහතික කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න).

අයදුම්පත්‍රය විධිමත් පරිදි නිලධාරියා විසින් භාර දුන් දිනය :——————.

——————,
අත්සන හා නිලමුද්‍රාව (ලේකම්/ ප්‍රධාන ලේකම්/
දෙපාර්තමේන්තු ප්‍රධානී).

දිනය :——————.

ඉහත සංශෝධනයන් සහිත අයදුම්පත්‍රය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් බාගත හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්.
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 ජූලි මස 10 වැනි දින.
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

07-805

---

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීමේ *ගැසට්* නිවේදනය පළ කර ගැනීම

2017.06.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2026 දරන *ගැසට් පත්‍රයේ* I වැනි කොටස ඃ (IIඅ) වැනි ඡේදයේ - පළකිරීම් - විභාග, විභාග ප්‍රතිඵල ආදිය යටතේ පළවූ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම් *ගැසට්* නිවේදනයේ 7.4 සහ 7.5 ලෙස පහත සඳහන් කොටස ඇතුළත් විය යුතුය. ඃ

7.4 උක්ත තනතුරු සඳහා සීමිත බඳවා ගැනීම් යටතේ සුදුසුකම් ලබන්නේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ, ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් සහිතව තනතුරෙහි ස්ථිර කර ඇති අය පමණකි.

7.5 වයස් සීමාව ඃ අදාළ නොවේ.

කේ. එන්. යාපා,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.

07-684

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.